# 12

# පැදි මිහිර





ගැමි ජනයා අතර ජනප්‍රිය එක් කවි වර්ගයක් තේරවිලි කවි යන නමින් හැඳින්වෙයි. බොහෝ තේරවිලි කවි තනි කවියක් ලෙස නොව කවි යුගලයක් ලෙස ඉදිරිපත් වේ. මුල් කවිය ගැටලුවක් ඉදිරිපත් කරයි. දෙවැන්න ඊට විසඳුමක් සපයයි. පහත දැක්වෙන කවි කියවා බලන්න.

උඩින් දුවන වී තෝරා එවාපන්
බිමින් දුවන වී තෝරා එවාපන්
ගේ ළඟ සිටින වී තෝරා එවාපන්
වෙල්වල පැසෙන වී තෝරා එවාපන්

උඩින් දුවන වී ගිරවී නොවේදෝ
බිමින් දුවන වී හාවී නොවේදෝ
ගේ ළඟ සිටින වී පරෙවී නොවේදෝ
වෙල්වල පැසෙන වී මාවී නොවේදෝ

ගසට නමකි ගස මැරුණම වෙන නමකී
ගෙඩියට නමකි ගෙඩියේ සුඹුලට නමකී
මදයට නමකි මද කනකොට වෙන නමකී
මෙතුන් පදේ තෝරාලා කියන් සකී

ගසට ගොයම් එය මැරුණම පිදුරු වෙති
ගෙඩියට වී සුඹුලට දහයියා වෙති
මදට හාල් පිසිනා කලට බත් වෙති
එතුන් පදේ තේරුම නම් එහෙම වෙති

* * * * * * * *

අපේ ළමා ගීත අතර 'හඳ' ගැන ලියැවුණු කවි හා ගීත බොහොමයක් ඇත. හඳ පායා එන විට අහසේ හා එම පරිසරයේ සුන්දරත්වය දැකීමට කුඩා දරුවෝ කැමැත්තක් දක්වති. මෙය එවැනි ජනප්‍රිය ළමා ගීතයකි.



ඉරු බැසැ යන්නේ
අඳුරු වැටෙන්නේ
සිසිල් සුළං ඇගේ හැපී මා නළවන්නා
කුරුල්ලනේ, මා තනි කැරැ ඇත නොයල්ලා
එබී බලන්නේ ඇයි හඳ මාමේ ඉරු බැසැ................

මී මැස්සන් රුං ගාමින් ඉගිලී යන්නා
නෙළුම් මලේ මල් පෙති එක එක පියැවෙන්නා
එබී බලන්නේ ඇයි හඳ මාමේ ඉරු බැසැ ................

විලේ ඕලු මල් හැකිලී නින්දට යන්නා
කුමුදිනීගෙ රුව ටික ටික අපට පෙනෙන්නා
එබී බලන්නේ ඇයි හඳ මාමේ ඉරු බැසැ................
හෙමෙන් හෙමෙන් වවුලන් දුන් එළියට එන්නා
තණකිරවුන් නාද දිදී පැනැ පැනැ යන්නා

එබී බලන්නේ  ඇයි හඳ මාමේ  ඉරු බැසැ ................

කනාමැදිරි එළිය දෙමින් අඳුර හරින්නා
හඳ මාමා තරු පිරිවර සමඟ මැ එන්නා
    එබී බලන්නේ  ඇයි හඳ මාමේ  ඉරු බැසැ................

හෙළ ගොවියන් වැඩ නිමැ වී ගෙවලට යන්නා
කුඩා ළමුන් කුලදෙවියන් වැඳැ සැනැසෙන්නා
    එබී බලන්නේ  ඇයි හඳ මාමේ  ඉරු බැසැ ................

**සුනිල් ශාන්ත**



## ක්‍රියාකාරකම 01

කණ්ඩායම් වශයෙන් බෙදී, මෙම කවි හා ගීතය ගායනා කරන්න.

இக் கவிதையையும் பாட்டையும் குழுவாகச் சேர்த்து தாலத்துடன் பாடவும்.

## ක්‍රියාකාරකම 02

පන්තිය කණ්ඩායම් දෙකකට බෙදී තේරවිලි ගී ගායනා කරන්න.

வகுப்பை இரண்டு குழுக்களாகப் பிரித்து மேற்படி நாட்டார் பாடலைப் பாடவும்.

1 කණ්ඩායම තේරවිලි කවිය

2 කණ්ඩායම පිළිතුරු කවිය

## ක්‍රියාකාරකම 03

අංග චලනය යොදා ගනිමින් සාමූහික ලෙස ගීතය ගායනා කරන්න.

பாட்டை அங்க அசைவுகளுடன் சேர்த்து ஒன்றிணைந்து பாடவும்.

## ක්‍රියාකාරකම 04

ගුරුතුමා/ගුරුතුමිය සමඟ එකතු වී තේරවිලි කවිවල හා ගීතයේ අර්ථය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

ஆசிரியருடன் சேர்ந்து நாட்டார் பாடல்கள் மற்றும் கவிகளின் பொருள் பற்றிக் கலந்துரையாடுக.

## ක්‍රියාකාරකම 05

මෙම පාඩමේ ඔබේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

இப் பாடத்தில் உள்ள உள்ளத்தையீர்த்த சந்தர்ப்பம் ஒன்றை சித்திரமாக வரைக.